ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මද්දුමාගේ දයාශ්‍රීලාල් ජයලත් කුමාරසිරි, (ජා. හැ. අංක 600704559V), මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් උපතිස්ස මඩපාතගේ මහතා විසින් ලියා සහතික කළ අංක 2064 සහ වර්ෂ 2009.12.08 දින දරන ඇටර්නි බලපත්‍රය මගින් පෝරුව දණ්ඩ, පහුරු තොට අංක 288/ඩී හි පදිංචි ඇත්දත්වඩුගේ නෙරන්ජන් රත්නකුමාර (ජා. හැ. අංක 841644247 V) වෙත දී ඇති ඇටර්නි බලය වර්ෂ 2012.01.01 වැනි දින සිට බල පවත්වන පරිදි අවලංගු කරන බවත් ඔහු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ගනුදෙනුවකට හෝ ක්‍රියාවකට මාගේ වගකීමක් නොමැති බවත් ශ්‍රී ලංකා ජනරජයට සහ මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

මද්දුමාගේ දයාශ්‍රීලාල් ජයලත් කුමාරසිරි.

01-560

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දකුණු ඉන්දියාවේ, තමිල්නාඩු, දේවකොට්ටායි, ඒ. ආර්. එල්. නිවසේ අංක 05 දරන ස්ථානයේ පදිංචිව සිට දැනට දකුණු ඉන්දියාවේ, තමිල් නාඩු, ඊරෝඩ් 638001, සීනියන් තෝට්ටම්, වෙන්කටසාමි වීදියේ, අංක 40 දරන ස්ථානයේ පදිංචි ඉන්දියානු විදේශ ගමන් බලපත් අංක එච්. 2740638 හිමි ඉරමා වීරප්පන් චෙට්ටියාර්ගේ වැඩිමහල් පුතා වන වී. ආර්. සෞන්දරරාජන් වන මා, ශ්‍රී ලංකා ජනරජයේ, මධ්‍යම පළාතේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ, මහනුවර, කටුකැලේ, පේරාදෙණිය පාරේ, අංක 10/1 දරන ස්ථානයේ පිහිටා ඇති ශ්‍රී සෙල්ව විනයාගර් කෝවිල සහ දේවාලගම *නොහොත්* පුල්ලියාර් කෝවිලේ ඒ. ආර්. එල්. එස්. එන්. වී. ආර්. භාරයේ පරම්පරාවෙන් උරුම වූ භාරකරු මා බවට, මම මෙයින් තහවුරු කරන අතර 1995 ජනවාරි මස 09 වැනි දින එස්. එස්. බාලසුබ්‍රමනියම් (විද්‍යාවේදී, එල්.එල්.බී.) දකුණු ඉන්දියාවේ, තමිල් නාඩු, සිවගන්ගායි දිස්ත්‍රික්කයේ, දේවකොට්ටායිහි නීතිඥ සහ නොතාරිස් මහතා විසින් ලියා සහතික කරන ලද පත් ඉරු අංක 104/26 යටතේ මහනුවර, මධ්‍යම කලාප කාර්යාලයේ 1995 ජනවාරි මස 18 වැනි දින ලියාපදිංචි කරන ලද ඇටර්නි බලපත්‍රය මගින් ඉහත කී ශ්‍රී සෙල්ව විනයාගර් කෝවිල සහ දේවාලගම නොහොත් පුල්ලියාර් කෝවිලේ ඇටර්නි සහ පරිපාලන කළමණාකරු වශයෙන් මා වෙනුවෙන් සහ මාගේ නාමයෙන් කටයුතු කිරීම සඳහා මහනුවර, රජපිහිල්ල මාවතේ, අංක 213 දරන ස්ථානයේ පදිංචි සිට දැනට මහනුවර, කටුකැලේ, පේරාදෙණිය පාරේ, අංක 10/1 දරන ස්ථානයේ පදිංචි ගෝවින්දසාමි ක්‍රිෂ්ණමූර්ති නොහොත් ගෝවින්දසාමි පිල්ලේගේ පුත් ජී. ක්‍රිෂ්ණමූර්ති මහතා වෙතට මා විසින් ලබා දුන් ඇටර්නි බලය 2011 දෙසැම්බර් මස 19 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කොට, අහෝසි කොට, නිෂ්ප්‍රභා කරන බවට සියලුම ලංකාවාසී ජනතාව වෙත සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙතට මෙයින් දැනුම් දෙමි.

මෙයින් ඉදිරියට ඉහත කී 1995 ජනවාරි මස 09 වැනි දිනැති ඉහත කී ඇටර්නි බලපත්‍රය යටතේ ඉහත කී ජී. ක්‍රිෂ්ණමූර්ති මහතා විසින් කරනු ලබන හෝ ක්‍රියා කරනු ලබන ඕනෑම ක්‍රියාවක් සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් නොදරන අතර පිළිනොගන්නා අතර අපරානුමත නොකරමි.

වී. ආර්. සෞන්දරරාජන්.

01-513

---

### දැන්වීමයි

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පයාගල, හල්කඳවිල, යොවුන්ගම, අංක 115 හි පදිංචි ගුලවිට ගණිතගේ රම්‍යලතා වන මම, වර්ෂ 2010 පෙබරවාරි 22 දින සනත් ගුණතිලක, ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කළ අංක 1796 දරන ඇටෝර්නි බලපත්‍රලාභියා වන බෙන්තොට, මීරිස්වත්ත, සූරියවිමන, අංක 313/100/3 හි පදිංචි ජයලත් ආරච්චිලාගේ ජයසිරි යන අයට එකී ඇටෝර්නි බලපත්‍රයෙන් මා වෙනුවෙන් කටයුතු කිරීමට දෙන ලද බලතල සියල්ල අහෝසි කරන බව ද ඉහත කී අංක 1796 දරන ඇටෝර්නි බලපත්‍රය බලරහිත කළ බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ගුලවිට ගණිතගේ රම්‍යලතා.

01-510

---

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

එක්සත් අරාබි එමීර්, ඩුබායි, තැ. පෙ. 2393, බිල්ට් මිඩල් ඊස්ට් හි හා දැනට කැනඩාව, ටොරන්ටෝ L 3 P 2A3 ඔන්ටාරියෝ මාකම් පීටර් ස්ට්‍රීට් අංක 13 හි පදිංචි සාගර වීරතුංග වන මා විසින් අංක 118/4, පිරිවෙන පාර බොරලැස්ගමුව හි ප්‍රසාද් මොහාන් පතිරණ යන අය වෙනුවෙන් එක්සත් අරාබි එමීර් ඩුබායිහි ශ්‍රී ලංකා කොන්සියුල ජනරාල් කේ. කිඩ්නපිල්ලේ ඉදිරිපිට දී 2009.10.01 දින අත්සන් කළ හා නුගේගොඩ දෙල්කඳ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දී ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 39 වැනි කාණ්ඩයේ 31 වැනි පත්‍රිකාවේ දිනපොත් අංක 5633 යටතේ 2009.10.08 වැනි දින ලියාපදිංචි කර ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය බලරහිත කොට අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව හා මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

මින් මතුවට ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට, බලයකට, ඔප්පුවකට හෝ කරුණකට ඔහු වෙනුවෙන් මා වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

සාගර වීරතුංග.

2011 දෙසැම්බර් මස 06 වැනි දින.

01-405

---

### සමාගම් නාමය වෙනස් කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (2) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීම

නව සමාගම් නාමය : ද ටීම් සික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
කලින් ව්‍යවහාර වූ නාමය : ටීම් ෆෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 6868
ලියාපදිංචි කළ දිනය : 2011.11.30
කාර්යාල ලිපිනය : අංක 152, සීදුව පාර, උඩුගම්පොල.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ, හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

01-404

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය**

මොරටුව, රාවතාවත්ත, ගාලු පාරේ, අංක 045 හි ලියාපදිංචි අංක පී වී 83085 දරන හර්මිටේජ් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඞ් 2011 දෙසැම්බර් මස 13 වැනි දින සංස්ථාපනය කරන ලද බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ.

01-406

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ මහජනතාවට කෙරෙන දැනුම්දීම

2011.10.06 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 8173, යටතේ සිලෝන් බිස්නස් ඉනෝවේෂන් (පීවීටී) එල්ටීඩී ලියාපදිංචි ලිපිනය 1481/2/10, හෝකන්දර පාර පන්නිපිටිය යන ලිපිනයේ නව සමාගමක් ලියාපදිංචි කරන ලද අතර, එය 2011.12.22 වැනි දින ලියාපදිංචි අංක පී වී 81731 ලියාපදිංචි ලිපිනය 1481/2/10, හෝකන්දර පාර, පන්නිපිටිය යන ලිපිනයේම සිලෝන් බිස්නස් ඉනෝවේෂන්ස් (පීවීටී) එල්ටීඩී යන නමින් නැවත ලියාපදිංචි කළ බව මෙයින් මහජනතාවට දැනුම් දෙනු ලැබේ.

කේ. ඒ. ජේ. සී. අමරසිංහ,
අධ්‍යක්ෂ.

01-407

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීම

සමාගම් නාමය : ටානික්ස් ලංකා කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඞ්
සමාගම් අංකය : පී වී 82996
ලියාපදිංචි කළ දිනය : 2011.12.15
කාර්යාල ලිපිනය : අංක 291/32 ඒ, හැව්ලොක් පාර, කොළඹ 06.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඞ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

01-394

---

**සමාගම් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තරය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුව පහත විස්තරය දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කර ඇතः-

සමාගමේ නම : මොන්ඩෝ හෙයාර් ඇන්ඩ් බියුටි සැලෝන් (පුද්.) සමාගම
ලියාපදිංචි ලිපිනය : අංක 380/1/1, පේරාදෙනිය පාර, මහනුවර
ලියාපදිංචි අංකය : පීවී 82926
ලියාපදිංචි දිනය : 2011.12.07.

01-395

---

**සංස්ථාපනය පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය**

පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මහජනතාව වෙත කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි :-

සමාගමේ නම : සික්රා කන්සල්ටන්සීස් (ප්‍රයිවට්) ලිමිටඞ්
ලියාපදිංචි අංකය : පී වී 82893
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 185/4, හැව්ලොක් පාර,
කොළඹ 05.

01-433

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීම

සමාගම් නාමය : ඉමර්ජින් ලංකා බිස්නස් පාට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඞ්
සමාගම් අංකය : පී වී 82750
ලියාපදිංචි කළ දිනය : 2011.12.01
කාර්යාල ලිපිනය : අංක 174/1, පරණ කැස්බෑව පාර, දෙල්කඳ, නුගේගොඩ.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඞ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ, හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

01-439

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

අංක 31, අගලවත්ත පාර, මාතලේ හි පදිංචි සරත් සෙනවිරත්න වන මම, මහරගම ප්‍රසිද්ධ නොතාරිස් ජේ. කේ. මුනවීර මයා. විසින් 2006.03.16 වැනි දින ලියා සහතික කරන ලද අංක 220 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ඇටෝර්නි බලකරු ලෙස අංක 105/8, ශ්‍රී දේවානන්ද මාවත තිරුවානා කැටිය රත්නපුර පදිංචි කොටගහනීල් ජයරත්න නමැති අයට ලබා දී තිබූ අයිතිවාසිකම් බලපුළුවන්කාරකම් සහ බලතල 2011.12.19 වැනි දින පටන් බලරහිත සහ ශූන්‍ය වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

සරත් සෙනවිරත්න.

01-423

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 05, පොල්හේන්ගොඩ පාර, අංක 35/09 හි පදිංචි රංජන ශ්‍රීලාල් තේනබදු වන මා විසින් නාවල, කොස්වත්ත, තුන්වැනි පටුමග, අංක 27 බී හි පදිංචි බෙන්තරමහකුමාරගේ වරුණි මනීෂා රාජපක්ෂ ප්‍රනාන්දු නමැති අයට 2004.06.30 වැනි දින පී. අයි. සේනාරත්න, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කළ අංක 124 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රය මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගණුදෙනුවකට මා වග නොකියන බව ද ප්‍රකාශ කරනු ලැබේ.

රංජන ශ්‍රීලාල් තේනබදු.

01-443

---

## ඒකාබද්ධ කිරීමේ දැන්වීම

2007 වර්ෂයේ අංක 7 සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ දැනුම් දීමයි

සමාගමේ නම : සීමාසහිත 7 ජිරාෆ් පුද්ගලික සමාගම
සමාගම ලියාපදිංචි අංකය : පී වී 76081
ඒකාබද්ධ කළ දිනය : 2010.12.16
ලියාපදිංචි ලිපිනය : අංක 248/191, " ලෝටස් ග්‍රෝව්", හිල් වීදිය, දෙහිවල.

01-418

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ :-

සමාගමේ නම : සුජිත් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 82041
ලියාපදිංචි ලිපිනය : මැෂින් කඩේ හන්දිය, ගෝනුල්ල, ගෝනවිල
සංස්ථාපනය කළ දිනය : 2011.10.21.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

01-419

---

## නිවේදනයයි

සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් 2011 දෙසැම්බර් මස 21 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83269,
ලියාපදිංචි කාර්යාලය : අංක 267, යුනියන් පෙදෙස, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සෙක්රටරීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

01-434

## නිවේදනයයි

තැප්ප්‍රොබේන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් 2011 දෙසැම්බර් මස 21 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : තැප්ප්‍රොබේන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83271,
ලියාපදිංචි කාර්යාලය : අංක 267, යුනියන් පෙදෙස, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සෙක්රටරීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

01-435

---

## නිවේදනයයි

හෙළැන්කො හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් 2011 දෙසැම්බර් මස 21 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : හෙළැන්කො හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83263
ලියාපදිංචි කාර්යාලය : අංක 267, යුනියන් පෙදෙස, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සෙක්රටරීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

01-436

---

## නිවේදනයයි

කැන්විල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2011 දෙසැම්බර් මස 21 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : කැන්විල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83288
ලියාපදිංචි කාර්යාලය : අංක 267, යුනියන් පෙදෙස, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සෙක්රටරීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

01-437

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2011 දෙසැම්බර් මස 21 වැනි දින සංස්ථාගත කළ බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඉනොවේටිව් මොබයිල් ඇප්ලිකේෂන් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83264
ලියාපදිංචි ලිපිනය : අංක 543, මහකටුවාන පාර, හෝමාගම.

අධ්‍යක්ෂ.

01-438

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලබයි :-

සමාගමේ නම : සරත් මෝටර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 79102
ලියාපදිංචි ලිපිනය : අංක 153/9, නානායක්කාර මාවත, ඔබේසේකර පුර, රාජගිරිය
සංස්ථාපනය කළ දිනය : 2011 මැයි මස 31 වැනි දින.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

01-420

---

**සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය

සමාගමේ නම : ෆාම් ලයිව්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 83384
සංස්ථාගත කළ දිනය : 2011.12.28
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 20/12, නර්සින් හෝම් පාර, සාලියපුර, හැටන් , ශ්‍රී ලංකා.

සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

2011 දෙසැම්බර් මස 30 වැනි දින,
අංක 96 - 2/2, මල්වත්ත පාර,
කොළඹ 11.

01-385

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 7076, 7221, 8009, 8727 සහ 8936 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර දකුණු තොටමුණේ, අළුත්ගම් බැද්දේ, කළුවාමෝදර කාලවිල පිහිටි, ලොට් අංක 31 සහ 32 ලෙස පැවති, ඒකාබද්ධ කරන ලද, බලයලත් මිනින්දෝරු ජී. එල්. ඩබ්ලිව්. පෙරේරා විසින් සාදන ලද 2002 සැප්තැම්බර් මස 14 වැනි දිනැති අංක 2256 A දරන පිඹුරේ ලොට් අංක 02 ලෙස දැක්වෙන බිම් කට්ටිය සහ එහි පිහිටි පස, ගස්වැල්, වගාවන්, ගොඩනැගිලි ආදී සියල්ල ඇතුළත්ව,

ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූඩ් 0, පර්. 18.19

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පුංචිහේවා විසින් සහතික කරන ලද 2004 ජනවාරි මස 25 වැනි දිනැති අංක 7076 දරන, 2004 ජූලි මස 27 වැනි දිනැති අංක 7221 දරන 2006 මැයි මස 04 වැනි දිනැති අංක 8009 දරන, 2007 නොවැම්බර් මස 04 වැනි දිනැති අංක 8727 දරන සහ 2008 මැයි මස 26 වැනි දිනැති අංක 8936 දරන උකස්කරයන් ප්‍රකාර, හේමන්ත ෆුඩ් සිටි නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන, බේරුවල පදිංචි, වෙත්තමුණි කමල් හේමන්ත ද සිල්වා විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2012 පෙබරවාරි මස 09 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.- මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය. :

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 66,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු,

තීරු බදු, හෝ අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි".

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතිය ලත් සහ ශ්‍රී ලංකාවේ
එකම ISO 9001 : 2008 තත්ත්ව සම්මාන
ලත් පිළිගත්, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371,
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176,
ඊමේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය :www.sandslanka.com

01-492

---

### හැටන් නැෂනල් බැංක් පීඑල්සී - මාරවිල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සීමාවේ දකුණු පිටිගල් කෝරලේ මැද පළාතේ මුදුන්කටුව ගමේ මකුළුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක පී. එච්. ඊ. මෙන්ඩිස් විසින් ලියා සහතික කරන ලද 1979.06.27 වැනි දිනැති අංක 4055 පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් බින්දුවයි පර්චස් දහතුනයි දශම පහ (අ.0, රූ. 0, පර්. 13.5) ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ ඊට අයත් සියලුම දේද වේ.

මෙම දේපළ, වර්ණකුලසූරිය රංජිත් නිශාන්ත ප්‍රනාන්දු ණයකරු හැටියට හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. එම්. ඩී. ජයසිංහ විසින් සහතික කරන ලද්දා වූ ද 2008.10.31 දිනැති අංක 17866 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.-* මාරවිල ඔරලෝසුව කණුව ළඟින් කොළඹ පාරේ මීටර් 800 ක් පමණ ගොස් ඉන් පසු දකුණට හැරී මීටර් 150 ක් පමණ සමගි මාවත දිගේ ගොස් වමට හැරී මීටර් 25 ක් පමණ අඩි 10 ක් පළල ගුරු පාරේ දිගේ ගිය විට දකුණු පැත්තේ ඇති ඉඩමට පිවිසිය හැක.

හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ වර්ෂ 2012 ක් වූ පෙබරවාරි මස 15 වැනි දින පෙ.ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* වර්ෂ 2010.05.07 වැනි දින ද "දිවයින", ද අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත්වල 2010.05.12 වැනි දින ද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය:-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකක්) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) ද,
4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ක් සියලුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු හා විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ක්.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ (සියයට අනූවක්) මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු, (අය කිරීම් අංශය), හැටන් නැෂනල් බැංක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 011-2661821, 011-2661835.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ,
තක්සේරුකරු සාම විනිසුරු,
(මුළු දිවයිනටම).

කාර්යාලය : 011-5756356, 011-2334808, 071-8760986.

01-546

---

### සෙලාන් බැංකුව පීඑල්සී - බොරලැස්ගමුව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ, උඩුගම්පල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද 1989.11.26 දිනැති අංක 5226 ඒ දරන සැලැස්මේ නිරූපනය වන උඩුගම්පල කොටුගොඩ පාර වරිපනම් අංක 52 දරන පිල්ලෑදුගොඩැල්ලවත්තේ කැබැල්ල නමැති ඉඩමේ ලොට් ජී ලෙස ලකුණු

කළ රූඩ් දෙකයි පර්චස් පහක් (අ. 0, රූ. 2, පර්. 05) විශාල ඉඩම සහ ගොඩනැගිලි, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලුදේත්.

පහත සඳහන් මාර්ගය සඳහා වෙන්කිරීම තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සහ සියලු වෙනත් අයිතීන් සමග, පෙර කී සැලැස්මේ නිරූපනය වන එකී අංක 5226ඒ දරන සැලැස්ම අනුව ලොට් ජේ ලෙස ලකුණු කළ (පාර සඳහා වෙන් කිරීම) පර්චස් දහසයක් (අ. 0, රූ, 0, පර්. 16) විශාල ඉඩම් කොටස.

මෙම දේපළ මහරගම සංස්ථාගත කිරීමේ සහතික අංක පීවී 5441 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන කිෂානි ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ වර්ෂ 2012 ක් වූ පෙබරවාරි මස 08 වැනි දින පෙ.ව. 9.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ප්‍රවේශය*.- ගම්පහ නගරයේ සිට මිනුවන්ගොඩ පාරේ උඩුගම්පොල හන්දිය දක්වා ගමන් කර එතැනින් කොටුගොඩ පාරට වමට හැරී මීටර් 100 ක් දක්වා දුර ගමන් කළ විට අදාළ දේපළ ප්‍රධාන පාරට මුහුණලා දකුණු පැත්තේ හරියටම පන්සල ඉදිරිපිට පිහිටා ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.09.26 වැනි දින ඩේලි මිරර් සහ ලංකාදීප පුවත්පත් ද 2011.11.05 වැනි දිනැති තිනකුරල් පුවත්පත ද 2011.09.23 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රය* ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

(1) ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
(2) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් සියයට එකක් (1%) ක් ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
(4) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
(5) ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
(6) සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න, ප්‍රධාන කළමනාකරු (නීති දෙපාර්තමේන්තුව), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. (දුරකථන අංකය 0112-456480/0112-456458).

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441,
0714-424478,
ෆැක්ස් අංකය : 0112-345975.

01-540

---

**මහජන බැංකුව - අම්බලන්තොට ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වටිනා නිවාසමය දේපළක් විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහනගර සභා සීමාව තුළ කොල්ලුපිටියේ ඩිනිස්ටන් පෙදෙස, වරිපනම් අංක 59 හි පිහිටි කැබලි අංක 18 A 3 Z ට බලයලත් මානක එස්. එච්. බී. ජෝසප් මහතා විසින් 1975.07.12 දින සකස් කළ අංක සී/38/75 දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 16.5) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි ආදී සියලුම දේද වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2012 ක් වූ පෙබරවාරි මස 10 වැනි දින පෙ.ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා.- 2007.12.20 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2008.03.07 වැනි දින දිනමිණ, ඩේලි නිවුස්, සහ තිනකරන් පුවත්පත්වල පලකර ඇති වෙන්දේසි යෝජනාවන් සඳහා අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම*.- කොළඹ 03, කොල්ලුපිටියේ, ඩුප්ලිකේෂන් පාරෙන් දකුණු පසට ඇති ඩින්ස්ටන් පෙදෙස වරිපනම් අංක 59 දරන ස්ථානයේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
5. විකුණුම් වියදම් සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත ගාල්ල, අංක 22, පහළ ඩික්සන් පාරේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 091-2232311, 091-2234174, 091-2234171,
ෆැක්ස් අංකය : 091-2232230.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන පරිදි සඳහන් කළ මුදල් දින තිහක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සමාදාන විනිශ්චයකාර,
(මුළු දිවයිනටම).

*කාර්යාලය* : අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12,
*දුරකථන අංක* : 011-5756356, 071- 8760986.
*නිවස* : 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංකය : 011-2419126.

01-545

**හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - කඳාන ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1991 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කඳාන ප්‍රසිද්ධ නොතාරිස් කේ. එම්. නිලන්ති විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැංකුව පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2008.09.02 දින අංක 628 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පොන්වීර ආරච්චිගේ දොන් නුවන් හර්ෂන සහ කොන්ගම පතිරැන්නහැලාගේ දොන් එතෙල් ශ්‍රීමා පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුලත්ව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල, 2012 පෙබරවාරි 22 වැනි දින පෙ.ව. 11.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වල්පල මිල්ලගහවත්ත නැමති ඉඩමට බලයලත් මානක එච්. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද 2007.02.10 දිනැති අංක 3187 දරන පිඹුරේ ලොට් අංක 01 බී දරන ඉඩම් කොටස විශාලත්වය ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 6.2) ක් වේ.

*වැඩි දුර විස්තර සඳහා.-* 2010.05.07 වන දින රජයේ ගැසට් පත්‍රය හා 2010.05.11 දින දිවයින, අයිලන්ඩ්, හා තිනකරන් පුවත් පත් බලන්න.

*දේපලට පිවිසීම.-* කොළඹ - මීගමුව පාරේ කඳාන හන්දියට පැමිණ ගනේමුල්ල පාරේ වැව හන්දියට පැමිණ අනතුරුව මීටර් 500 ක් පමණ පසුකර පාසැල් පන්සල් භූමියට පිවිස දකුණු පස ඇති පාසල් මාවතේ මීටර් 200 ක් දේපළට පිවිසෙන මාර්ගයේ දකුණුපස මීටර් 300 ක් පමණ ගමන් කල පසු එම පාරේම වම් පස අදාල දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන්වනවාත් සමගම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය තීන්දු කල විගස ගැනුම් මිලෙන් 10 %ක මුදලක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදලද,
3. ගැනුම් මිලෙන් 2 1/2% ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදලද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000 ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 1000 ක් ද,
6. ප්‍රචාරක වියදම් ද.

ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට ද එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට ද බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු තැන (ණය අයකර ගැනීම) හැටන් නැෂනල් බැංකුව පීඑල්සී අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-2320074 හෝ 073151356.

01-539